**ඌවපරණගම ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
**--------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**
----------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
---------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 21 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර,එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 අගෝස්තු 30 වන දින සභාපතිවරයාට යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ඌවපරණගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
----------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**
----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට භෞතිකව නොමැති බ්ලොක් ගල් තොගයක වටිනාකම වූ රු.5,470,180 ක් ගිණුම්වල දැක්වීමෙන් ජංගම වත්කම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත ණය හිමියන් රු.67,550 ක් වැඩියෙන් දක්වා තිබීමෙන් එම වටිනාකමෙන් වියදම් හා වගකීම් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් වටිනාකම රු.36,596 ක් වගකීම් ලෙස හඳුනා නොගැනීමෙන් එම වටිනාකමින් වියදම් හා වගකීම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සභාව විසින් ඉකුත් වර්ෂයේදී ඉඩම් පවරා ගැනීම සඳහා ගෙවා තිබුණු රු.9,281,250 ක් අත්තිකාරම් යටතේ ලෙජරයේ සටහන් නොකිරීම නිසා එම වටිනාකමින් වත්කම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ පරිග්‍රහන ලේඛනයෙන් ඉවත් කර තිබුණු වටිනාකම රු.12,807 ක්වූ පුස්තකාල පොත් සඳහා ගිණුම්වල අවශ්‍ය ගැලපීම් නොකිරීම හේතුවෙන් එම වටිනාකමින් වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීම වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) වර්ෂය අවසානයට පැවති රු. 35,050 ක කොම්පෝස්ට් පොහොර තොගය ගිණුම් වලින් අත්හැර තිබීම නිසා එම වටිනාකමින් ජංගම වත්කම් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ අවසානයට වූ විවිධ තැන්පත් රු.106,368 ක් වැඩියෙන් ගිණුම්ගත කිරීම නිසා එම වටිනාකමින් වගකීම් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) පෙර ගෙවුම් රු.500,000 ක් වැඩියෙන් ගිණුම්ගත කිරීම නිසා ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.2 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

----------------------------------

(අ) **ලැබිය යුතු ගිණුම්**

---------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අය කරගත යුතු රු.29,260,533 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ තුළ වර්ෂ 02 ක හිඟහිටි අක්කර බදු රු.2,738 ක්,හිඟහිටි කඩකුලී රු.412,565 ක්,ජල ගාස්තු 1,239,275 ක්, පොල බදු රු.12,516 ක් හා වර්ෂයක හිඟහිටි පොලී ආදායම් රු.490,102 ක් ප්‍රාග්ධන ආධාර රු.27,103,336 ක් ඇතුළත් වී තිබුණි.

(ආ) **ගෙවිය යුතු ගිණුම්**

---------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 32,664,059 ක් වූ ක් වූ ගෙවිය යුතු ශේෂය තුළ වසර 02 ක් වූ කර්මාන්ත ණය හිමියෝ රු.32,540,518 ක්,වසරක් වූ පොදු සැපයුම් ණයහිමියෝ රු.93,833, ක් සහ වෙනත් ණයහිමියෝ රු.29,707 ක් ඇතුළත් වී තිබුණි.

1.3.3 **අනුකූල නොවීම්**

-------------------

**නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**

--------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 49 වන වගන්තිය | සභා බල ප්‍රදේශය තුළ පවත්නා අනවසර ඉදිකිරිම් හදුනාගැනීම සඳහා සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ආ) | ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන ) රීති | |
| | (i) රීති 214 | ගබඩා භාණ්ඩ පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| | (ii) රීති 217 | සභාව සතු ඉඩම් වෙන්කර සැළසුම් සකස් කර තිබිය යුතු අතර, වාර්ෂික සමීක්ෂණයක් සිදු කර අදාල දේපළ සම්බන්ධයෙන් කාලීන වාර්තා සකස් කළ යුතු වුවත්,එසේ සකස් කර නොතිබුණි. |

| | |
|---|---|
| (iii) රීති 218 | වර්ෂයකට වරක් සභාවේ ඉඩම් හා ගොඩනැඟිලි පිළිබඳව සමීක්ෂණයක් සිදුකර වාර්තා යාවත්කාලීන කර නොතිබුණි. |

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,967,366 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වු ආදායම රු.8,889,000 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු | රු | රු | රු | රු. |
| (i)වරිපනම් හා බදු | 2,269,540 | 2,812,020 | 2,674,918 | 756,897 | 1,819,540 | 2,294,621 | 1,599,210 | 1,284,895 |
| (ii) කුලී | 1,451,000 | 873,832 | 929,649 | 503,278 | 11,930,000 | 849,834 | 836,155 | 323,631 |
| (iii) බලපත්‍ර ගාස්තු | 700,000 | 40,000 | 980,280 | -- | 665,000 | -- | 654,170 | 17,650 |
| (iv)වෙනත් ආදායම | 11,584,000 | -- | 6,592,877 | 5,301,710 | 15,562,000 | -- | 10,078,348 | 5,105,606 |
| එකතුව | 16,004,540 | 3,725,852 | 11,177,724 | 6,561,885 | 29,976,540 | 3,144,455 | 13,167,883 | 6,731,782 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

2017 දෙසැම්බර් 31 දිනට මුළු බිල්කල ආදායම රුපියල් මිලියන 3.7 ක් වූ අතර, වර්ෂය තුල රැස්කල ආදායම රුපියල් මිලියන 11.2 ක් විය. කෙසේ වුවත් වර්ෂය අවසන් වන විට රුපියල් මිලියන 6.5 ක ආදායමක් අයකර ගැනීමට තිබුණු අතර, පෙර වර්ෂය සමඟ සැසඳීමේදී හිඟ ආදායම් සියයට 2.5 කින් අඩුවී තිබුණි.

#### 2.2.3 කුලී

රංහවඩිගම කඩ කාමර ඉදිකිරීම සඳහා සභාවට අයත් බිම් කොටස් බදුදීම තුළින් බදුකරුවන් 10 දෙනෙකුගෙන් 2000,2005 හා 2006 වර්ෂ වලදී අයකරගෙන තිබුණු රු.121,000 ක් අදාල වර්ෂවල ආදායමක් ලෙස ගිණුම්ගත නොකර විවිධ තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

2.2.4 **බලපත්‍ර ගාස්තු**

-----------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2017 වර්ෂයට වෙළඳ බලපත්‍ර ලබා ගත යුතු සභා බල ප්‍රදේශයට අයත් ව්‍යාපාර 14 ක් සඳහා බලපත්‍ර නිකුත් නොකිරීම නිසා රු.14,000 ක ආදායම් අහිමිවී තිබුණි.

(ආ) 2017 වර්ෂය සඳහා ව්‍යාපාර බදු රු.9,900ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.5 **වෙනත් ආදායම්**

-------------------

(අ) සභාව සතු බැකෝ යන්ත්‍රය,මාර්ග තලනය හා ජල බවුසරය බාහිර පාර්ශවයන්ට කුලී පදනම මත ලබාදී තිබු නමුත් ඒ සඳහා අය විය යුතු රු.194,580 ක මුදල 2017 දෙසැම්බර් මස 31 දිනය වන විටත් අය කරගෙන නොතිබුණි.

(ආ) ඌව පළාත් කෘෂිකර්ම,වාරිමාර්ග හා මිරිදිය ධීවර කටයුතු අමාත්‍යාංශයෙන් අය විය යුතු රු.37,446 ක වාහන කුලී ආදායම් අය කරගෙන නොතිබුණි.

2.2.6 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

------------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.7,860,534 ක් සහ මුද්දර ගාස්තු රු.4,200,000 ක් අයවිය යුතුව තිබුණි.

03. **මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

3.1 **කාර්යසාධනය**

----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **ක්‍රියාකාරී සැලැස්ම**

---------------------

පනවා තිබු අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් සඳහා 2017 වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි.

**(ආ) තිරසර සංවර්ධන ඉලක්ක**

------------------------------

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගු කාලීන සැලසුම් 2017 දෙසැම්බර් 31 දින වනවිටත් සකස් කර නොතිබුණි.

3.2 **මානව සම්පත් කළමණාකරණය**

-----------------------------------

සභාවේ පුස්තකාලයාධිපති තනතුරු 01 ක්,කාර්මික නිලධාරි තනතුරු 01 ක් හා රියදුරු තනතුරු 01 ක් පුරප්පාඩුව පැවතුණි.

3.3 **වත්කම් කළමණාකරණය**

----------------------------

3.3.1 **පවරා නොගත් වත්කම්**

--------------------------

ඉකුත් වර්ෂයේ ලුණුවත්ත නගර සංවර්ධනය සඳහා හියුගෝලැන්ඩ් වතුයායෙන් අක්කර 7.5ක ප්‍රමාණයක් අත්පත්කර ගැනීම සඳහා රු.9,281,250 ක් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවා තිබුණු නමුත්, සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අදාළ කටයුතු සඳහා ඉඩම ප්‍රාදේශීය සභාවට පවරාගැනීමට කටයුතු කර නොතිබුණි.

3.3.2 **නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්**

---------------------------------------

කොන්ක්‍රිට් ගල් නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා භාවිතා කර තිබූ වටිනාකම රු.268,613ක් වූ සිමෙන්ති ගල් නිෂ්පාදන යන්ත්‍ර 02 ක් හා අදාළ අනෙකුත් පිරියත 2015 වර්ෂයේ සිට නිෂ්කාර්යව පැවතුණි.

3.4 **ප්‍රසම්පාදනය**

---------------

3.4.1 **ප්‍රසම්පාදන සැලැස්ම**

------------------------

(i) සභාව විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ii) 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජිත ආයතන ප්‍රසම්පාදන සංග්‍රහයේ 3:9:1 ප්‍රකාරව ඍජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ ව්‍යාපෘති පිරිනැමීමට ප්‍රජා පාදක සංවිධානය තෝරා ගැනීම නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් මඟින් තීරණය කළ යුතු වුවත් ප්‍රජාපාදක සංවිධාන 22 ක් තෝරා ගැනීම එසේ කමිටුවක් මඟින් තීරණ ගෙන නොතිබුණි.

04. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

-----------------------------------------

4.1 **අයවැය පාලනය**

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයෙහි ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේ දී ආදායම් විෂයයන් 06 ක සියයට 01 සිට සියයට 81 දක්වා වූ පරාසයක විචලනයක් සහ වියදම් විෂයයන් 07 ක සියයට 02 සිට සියයට 71 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

4.2 **අභ්‍යන්තර විගණනය**

------------------------

සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

4.3 **විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

-----------------------------------------------------

සමාලෝචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කර නොතිබුණි.

5. **පද්ධති හා පාලන**

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර,පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | **පද්ධතිය** | | **අඩුපාඩුව** |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | ආදායම්, වියදම් , හිමිකම් හා වගකීම් නිවැරදිව හඳුනාගෙන නොතිබීම. |
| | | (ii) | ගිණුම් ලෙජර් ශේෂ හා උපලේඛන ශේෂ නොසැසඳීම. |
| | | (iii) | ගිණුම් ලේඛන නඩත්තු නොකිරීම. |
| (අ) | ස්ථාවර වත්කම් | (i) | ඉඩම්, ගොඩනැගිලි හා ඇතැම් ස්ථාවර වත්කම් ගිණුම්ගත කර නොතිබීම හා හඳුනාගෙන නොතිබීම. |
| | | (ii) | සමහර වත්කම් නිෂ්කාර්යව පැවතීම. |
| | | (iii) | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබීම |
| (ආ) | තොග පාලනය | (i) | අවසන් තොග නිවැරදිව ගණනය කර නොතිබීම. |
| | | (ii) | තොග පාලන ලෙජරය නඩත්තු නොකිරීම. |